# ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇගළුම් කර්මාන්තය මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

**පී. එම්. පී. සී. ගජනායක,**[1]

## සංක්ෂේපය

වර්තමාන ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇගළුම් කර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයට අපනයන ඉපැයුම් වලට සහ සේවා නියුක්තිය සම්බන්ධයෙන් වැදගත් දායකත්වයක් සපයමින් ආර්ථිකයේ වැදගත් අංශයක් බවට පත් වී ඇත. මේ නිසා 1986 වර්ෂයෙන් පසුව කෘෂි අපනයන වලට ලැබී තිබූ වැදගත්කම කාර්මික අපනයන වලට විතැන් විය. මේ සඳහා දායකත්වය සැපයූ ප්‍රධාන කාර්මික අපනයන අංශය වූයේ ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇගළුම් කර්මාන්තයයි. ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තය පිළිබඳ මෙවැනි තත්වයක් පැවතුනත් මතුවන ගැටලුව වනුයේ මෙම කර්මාන්ත අංශය සැබෑ වශයෙන්ම මෙවැනි වැදගත් තත්ත්වයක පවතීද යන්නයි. මෙම අධ්‍යයනය ඒ සම්බන්ධවයි. මේ අනුව අධ්‍යයනයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇගළුම් කර්මාන්තයේ උපනතීන්, ගැටලු හා අනාගතයේ මුහුණ දීමට ඇති තත්ත්වයන් විමසා බැලීමයි. මෙවැනි අධ්‍යයනයක් මෙම අංශයේ ප්‍රතිපත්ති සම්පාදනයේදී වැදගත් වේ. මේ සඳහා භාවිතයට ගත් දත්ත ද්විතීක දත්ත වන අතර සේවක වැටුප්, ඇගළුම් නිෂ්පාදන ආදී දත්ත ලබා ගැනීමට සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරන ලදී. මෙම දත්ත සංඛ්‍යානමය, විශ්ලේෂණ ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කර ඇත. මේ අනුව අධ්‍යයනය මගින් හඳුනා ගත හැකි වූයේ ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇගළුම් කර්මාන්තය ප්‍රධාන වශයෙන් අපනයනයට යොමු වූ ආනයන අමුද්‍රව්‍ය මත දැඩි රැඳියාවක් දක්වන තත්ත්වයට පත් වී ඇති බවයි. එමෙන්ම මෙම අංශයේ එකතු කල අගය සාපේක්ෂව අඩු මට්ටමක පවතින අතර කෝටා ක්‍රමය, වෙළඳ ගිවිසුම්, බහුජාතික සමාගම් ආදිය ද මෙම කර්මාන්තයට අහිතකර ලෙස බලපා ඇත. ඒ අනුව මෙම කර්මාන්තය අතර පවතින අතරමැදිකරණය අවම කර විදේශීය පුද්ගලික ආයෝජන විශාල වශයෙන් මෙරටට ගෙන්වා ගත යුතුය. විදේශීය ආයෝජකයින් ගෙන්වා ගැනීමේ නව තාක්ෂණය භාවිතයත්, එමෙන්ම රට තුළ දේශපාලන ස්ථාවරභාවයත් සාමකාමී පරිසරයත් පවත්වා ගත යුතුය. එමගින් ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තය තුළ සැබෑ සංවර්ධනයක් හඳුනා ගත හැකි බව නිගමනය කළ හැක.

**මුඛ්‍ය පද :** ශ්‍රී ලංකාවේ ඇගළුම් කර්මාන්තය, දළ දේශීය නිෂ්පාදනය, අපනයන ඉපැයුම්, අතරමැදිකරණය

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, gayanigajanayaka@gmail.com